# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2013.06.25 |
| **වේලාව** | : | පෙ.ව. 10.00 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විදේශගතව සිටින බැවින් මෙදින මහා සභා රැස්වීමට සහභාගී නොවීය.

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය කියැවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2013 වර්ෂයේ මැයි මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී. එමෙන්ම අද දින මහා සභා රැස්වීම් වාරයට පැමිණි ගරු මන්ත්‍රීතුමන්ලා ද, ලේකම්තුමිය ද, මාධ්‍යවේදී මහත්ම මහත්මීන් ද, නගර සභාවේ සේවයට අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ද සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කළේය.

පසුගිය පොසොන් උත්සවය වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් ඇතුළු සමාජ සේවා පදනම බැතිමතුන් හට නොයෙකුත් සත්කාරයන් සිදු කළ බව ද, ඒ සඳහා සභා අරමුදලින් රු. 25,000.00ක මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබුවත්, දානපතියන්ගේ දායකත්වය ලැබීම නිසා එම මුදල් වැය කිරීම අවශ්‍ය නොවූ බව ද, ඉදිරියේ දී පැවැත්වෙන මිහිඳු පෙරහැර සඳහා සභා අරමුදලින් වෙන් කර ගත් පරිදි රු. 25,000.00ක මුදල ලබා දෙනු ලබන බව ද එතුමන්

සඳහන් කරන ලදී. දැහැමි නගරයක් තුළ දැහැමි සමාජයක් බිහි කිරීමට බලාපොරොත්තු වන බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය.

සබරගමුව පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමන් වෙතින් කරන ලද ඉල්ලීමට අනුව 'මග නැගුම' මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා මුදල් ප්‍රතිපාදන ලැබී ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදී. අබලන් වී තිබූ හුණුකුඹුර මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා රු. 725,000.00ක මුදලක් ලැබුණු බව ද, එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් ජනතාවට පහසුවෙන් ගමන් කළ හැකි වී ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී. එමෙන්ම කහටපිටිය මාර්ගය අළුත්වැඩියා කිරීමට හා තවත් මාර්ග 6ක් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී ඇති බව ද, එතුමන් විසින් දැනුම් දුන් අතර, මේ සම්බන්ධව පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමන් හට සභාවේ ස්තුතිය පළ කළ යුතු බව සඳහන් කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 ඔසුපැන් වෙළඳාම සඳහා ස්ථිර ස්ථානයක් ලබා ගැනීම - ඒ. ආර්. මොහොමඩ් හිලාල් මයා

ඖෂධ සහ ඔසුපැන් වෙළඳාම සඳහා ස්ථිර ස්ථානයක් ලබා දෙන ලෙස ජංගම ඔසුපැන් අලෙවි සේවාවක් පවත්වා ගෙන යාම සඳහා අවසර දෙන ලෙස බලන්ගොඩ, දෙහිගස්තලාව, අංක 409 ස්ථානයේ පදිංචි අබ්දුල් රසාක් මොහොමඩ් හිලාල් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 වරිපනම් සහනයක් ලබා ගැනීම - අංක 16/2, ටී. එස්. කුසුමා තැන්නහේන මිය

බලන්ගොඩ, එපිටපැත්ත, වෙට්නෝල් පාර, අංක 16/2 ස්ථානයේ පදිංචි ටී. එස්. කුසුමා තැන්නහේන යන අය විසින්තම ආර්ථික අපහසුකම් නිසා වරිපනම් සහනයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, වාර්ෂික වරිපනම් මුදලින් 25%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

### 06:03 නව පරිගණක මෘදුකාංගයක් ලබා ගැනීම හා පුස්තකාල ස්වයංක්‍රීයකරණය

ග්‍රන්ථනාම, සාමාජිකයන්ගේ විස්තර, පොත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රමාද වූ පොත් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීමේ ක්‍රියාවලීන් සඳහා පරිගණක මෘදුකාංගයක් ලබා ගැනීමට මහජන පුස්තකාලයෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන

ලදී. මේ සම්බන්ධව මහා සභාවේ සංවාදයට ලක් වූ අතර, අදාල අංශයන් සමග තව දුරටත් සාකච්ඡා ලක් කර පසුව තීරණයක් ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 මහජන පුස්තකාලයට අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම**

මහජන පුස්තකාලයට අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, දැනට මෙම සභාවේ 'විදුනැණ පියස' විද්‍යුත් පුස්තකාලය හරහා ජනතාව අන්තර්ජාල පහසුකම් ලබා ගන්නා බැවින් ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල සඳහා අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සම්බන්ධව පසුව සලකා බැලීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 අංක සී 5/ඒ කඩකාමරය පවරා දීම - අමිතා චාන්දනී නිලවීර මිය**

බළන්ගොඩ නගර සභාව විසින් මාසික බදු පදනම මත ලබා දී ඇති සී 5/ඒ කඩකාමරය කනගරත්න මුදියන්සේලාගේ ධර්මරත්න යන අය වෙත පවරා දෙන මෙන් ඉල්ලා දැනට එම කඩකාමරය හිමි බළන්ගොඩ, බෝම්බුව, පෙට්ටිගල පාර, 148 යන ස්ථානයේ පදිංචි, අමිතා චාන්දනී නිලවීර යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල ගාස්තු අය කර මේ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව තීරණය කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 වෙළඳ සංකීර්ණයේ හිස් කඩ කාමරය ඉල්ලීම - කේ. ඒ. මහින්ද මයා**

බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ හිස් කඩ කාමරයක් ලබා දෙන මෙන් බළන්ගොඩ, ඇල්ලෙපොල, සරස්වතී පාර, අංක 215 ස්ථානයේ පදිංචි කේ. ඒ. මහින්ද යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඔහු සඳහා අදාල ගාස්තු අයකර කඩ කාමරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 ඉරිදාපොල අංක 20 කඩකාමරය පවරා දීම - ඩී. ජී. ඩී. ප්‍රීති මානෙල් මිය**

බළන්ගොඩ ඉරිදා පොල අංක 20 කඩකාමරය බළන්ගොඩ, ඇල්ලවත්ත පදිංචි එච්. සිරිපාල යන අයට පවරා දීමට දැනට එය හිමි ඩී. ජී. ඩී. ප්‍රීති මානෙල් යන අය විසින් කැමැත්ත පළ කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර අදාල ගාස්තු අය කර බදු පදනම මත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 ගලිබවුසරයේ සේවය ලබා ගැනීම සඳහා ගෙවූ මුදල් ආපසු ඉල්ලුම් කිරීම**

බළන්ගොඩ, රත්නපුර පාර, ජයන්ති ටයර් සෙන්ටර් යන ස්ථානය සඳහා ගලි බවුසරයේ සේවය ලබා ගැනීමට මෙම සභාව වෙත ගෙවන ලද මුදල්, එම සේවය ලබා දීමට නොහැකි වීම හේතුවෙන් ආපසු ලබා දෙන මෙන් ඉල්ලා ජී. එම්. සුපුල් චමින්ද යන අය

විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, අදාල ගාස්තුවෙන් 10%ක ප්‍රමාණයක් අඩු කර ආපසු ගෙවීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 බස්නැවතුම්පොල ඉහල මහල ඩී. 17 කඩ කාමරය බදු පදනම මත ලබා ගැනීම**

දැනට හිස්ව ඇති බස්නැවතුම්පොල ඉහල මහල ඩී. 17 කඩ කාමරය බදු පදනම මත ලබා දෙන මෙන් බලන්ගොඩ, රජවක, ගොඩකුඹුර යූ. එම්. නිලූකා දයානි ජයකොඩි යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එම කඩ කාමරය සඳහා අයවීමට ඇති සියළු හිඟ මුදල් අයකර එම අය වෙත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 ඩී. 11/1 කඩකාමරය පවරා දීම**

මෙම සභාවට අයත් ඩී/11/1 දරන කඩකාමරය බලන්ගොඩ, තානායම් පිවිසුම් පාර, නො. 20යන ස්ථානයේ පදිංචි පී. කේ. ඩී. ඩී. එල්. ගුණරත්න යන අය වෙත පවරා දෙන මෙන් ඉල්ලා දැනට එම කඩකාමරය හිමි කේ. ජී. අජිත් අබේසුන්දර යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, මාස 6ක තැන්පත් හා මාස 3ක කුළිය අයකර පවරා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 'මග නැගුම' මාර්ග සංවර්ධන වැඩසටහන - 2013**

මග නැගුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂය සඳහා පළමු වතාවට කර්මාන්ත 15කටත්, දෙවන වතාවට තවත් කර්මාන්ත 2කටත් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, දෙවනුව ප්‍රතිපාදන වෙන් කළ කර්මාන්ත දෙකෙන් එකක් වන ''බලන්ගොඩ සුසාන භූමි මාර්ගය 1 අදියර '' සඳහා කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සුසාන භූමිය අභ්‍යන්තර මාර්ගය සඳහා සිදු කළ යුතුව ඇති බවත්, ''හුණුකුඹුර මහේෂ් මහතාගේ නිවාස වලට යන මාර්ගය - 1 අදියර'' යන කර්මන්තය, පළමු වතාවට ප්‍රතිපාදන වෙන් කරන ලද ''හුණුකුඹුර අතුරු මාර්ගය 1 අදියර'' යටතේ ඉදිකිරීම් සිදු කර ඇති බවත් ගරු සභාපතිතුමන් විසින් දන්වන ලද අතර, ඉහත අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සිදු කළ යුතු මාර්ගයන් මගනැගුම වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 වර්ෂාව හේතුවෙන් හානි වී ඇති මාර්ගය සාදා දීම**

පසුගිය කාලයේ පැවති දැඩි වර්ෂාපතනය හේතුවෙන් බලන්ගොඩ, අනඳමෙත්ගම, සියඹලාගහවත්ත යන ස්ථානයේ පදිංචි ඒ. කේ. අමරාවතී මැණිකේ යන අයගේ නිවසට යන මාර්ගය හානියට පත් වී ඇති බව මෙම සභාවට දන්වා ඇති බැවින් අදාල මාර්ගය නැවත සකස් කර ගැනීම සඳහා සභා අරමුදලින් රු. 5,000.00ක් ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 පුස්තකාල උපදේශක කමිටුවේ තීරණ**

2013.06.13 වන දින පැවති බළන්ගොඩ මහජන පුස්තකාලයීය උපදේශක කමිටුවේ තීරණයන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ඉහතින් ගෙන ඇති තීරණයන්ට යටත්ව අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 කියවීමේ කඳවුරක් පැවැත්වීම - මහජන පුස්තකාලය**

ර/බුද්ධ ජයන්ති විද්‍යාලයේ සහ ර/විද්‍යාලෝක විද්‍යාලයේ 6 වන ශ්‍රේණියේ සිසුන් 125 දෙනෙකු සඳහා කියවීමේ කඳවුරක් 2013.07.13 වන දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වීම සඳහා මහජන පුස්තකාලය ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දීමට අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර ආහාර වියදම් සඳහා ගරු සභාපතිතුමන් හා ධර්මසේන සමරසිංහ, අසංක නිල්මිණි විජයසිංහ යන ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා විසින් අනුග්‍රහය ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 2014 වර්ෂය සඳහා වරිපනම් පැනවීම**

බළන්ගොඩ නගර සීමාව තුළ පිහිටි සියළු දේපල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර අදාල ලේඛන භාර දී ඇති බැවින්, සහ 2012 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධනය අනුව සියළු දේපල සඳහා බදු මුදල් අය කිරීමටත්,

255 වන අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 238 වන වගන්තියේ (I) උප වගන්තියෙන් නගර සභාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම දේපළ වල 2012 තක්සේරු ප්‍රතිශෝධනය අනුව ලබා දී ඇති වර්ෂික වටිනාකම 2014 වර්ෂයේ වාර්ෂික වටිනාකම වශයෙන් පිළිගැනීමටත්,

එකී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්,

(අ) නේවාසික ස්ථාන මත සියයට හතර (4%) ක වරිපනමක් ද, සහ

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයක පහ (5%)ක වරිපනමක් ද,

2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, ඒ වරිපනම්, එකී නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය සමඟ කියැවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥා පනතේ 230 වන වගන්තියේ (2) වන උපවගනතියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලදී අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 රියදුරු සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් හා මැහුම් කුළිය**

රියදුරු සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් හා මැහුම් කුළිය සම්බන්ධව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් අදාල තනතුරු දරන්නන් දැනුවත් කිරීමට තීරණය කරන ලදී.

**06:17 කම්පන මාර්ගතලනය මිල දී ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ දී ගනු ලැබූ නිර්දේශයන්ට සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කරන ලද මූලික පිරිවිතරයන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම**

කම්පන මාර්ගතලනය මිල දී ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ දී ගනු ලැබූ නිර්දේශයන්ට සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කරන ලද මූලික පිරිවිතරයන් සහ කමිටු තීරණ නිර්දේශයන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 3R සංකල්පය හා ආපදා කළමනාකරණය පිළිබඳ දින 05ක වැඩසටහන - තායිලන්තය**

2013.07.14 සිට 2013.07.18 දක්වා තායිලන්තයේ බැංකොක් නුවර දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන වල නියෝජිතයන් සඳහා වන 3R සංකල්පය හා ආපදා කළමනාකරණය පිළිබඳ දින 05ක වැඩසටහන සඳහා මෙම සභාවේ නියෝජිතයන් සහ මාණ්ඩලික නිලධාරියකු සහභාගී කරවීමට කෙන්ස් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් තෝරා ගෙන ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා සහභාගී වීමට බලාපොරොත්තුවන ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට ඒ සඳහා ඉදිරිපත් වන ලෙස ඉල්ලීමක් කරන ලද අතර, එයට සහභාගී වන මාණ්ඩලික නිලධාරියා වශයෙන් මෙම සභාවේ ලේකම් එම්. එච්. සීලවතී මහත්මිය සහභාගී වීම සුදුසු බවට ද යෝජනා කරන ලදී.

එයට සහභාගී වීම සඳහා ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර හා එම්. ටී. එම්. රුමී යන ගරු නාගරික මන්ත්‍රීවරුන් කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

එම නාගරික මන්ත්‍රීවරුන් අදාල තායිලන්ත සංචාරය සඳහා සහභාගී කරවීමට ද, එම සංචාරයට සහභාගී වන ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ සභාවේ ලේකම්වරිය සඳහා 2013.07.14 සිට 2013.07.18 දක්වා නිවාඩු අනුමත කිරීමට ද, අදාල ගුවන් ටිකට් පත් සහ වැඩසටහන් ගාස්තු වශයෙන් එක් අයකුට රු. 89,000.00 බැගින් සභා අරමුදලින් ගෙවීමට ද, ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 පූර්ව මිශ්‍රණය යොදා මාර්ග නඩත්තු කිරීම**

මාර්ග නඩත්තු කිරීම සඳහා පූර්ව මිශ්‍රණය යොදා මාර්ගයේ පලුදු තැන් මැකීම දැනට ක්‍රියාත්මක වන අතර, මෙය සාමාන්‍ය වශයෙන් පලුදු ඇති මාර්ග වලට සුදුසු බවත්, විශාල පලුදු ඇති මාර්ගයන්ට නුසුදුසු බවත්, එබැවින්, මෙම මාර්ග සඳහා ගල් අතුරා, රෝල යොදා, පලුදු මැකීම සිදු කර, සම්පූර්ණ මාර්ගය සඳහාම දෙවන වර තාර ආලේප සිදු කිරීම සුදුසු බවට කාර්මික නිලධාරී විසින් දන්වා ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමන් ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:20 ර/කුමාර විද්‍යාලය සඳහා ගලිබවුසරයේ සේවය ලබා දීම

ර/බලන්ගොඩ කුමාර විද්‍යාලය සඳහා ගලි බවුසරයේ සේවය ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ගාස්තු අය කිරීමකින් තොරව අදාල සේවය සැපයීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:21 දෘශ්‍යාබාධිත පුද්ගලයකු සඳහා කඩ කාමරයක් ලබා දීම

වසර 17ක පමණ කාලයක් තිස්සේ දෘශ්‍යාබාධයකින් පෙලෙන, බලන්ගොඩ, විකිලිය, සමනල යොවුන්ගම පදිංචි ලක්ෂ්මන් රෝහන වික්‍රමරත්න යන අය විසින් බලන්ගොඩ මහජන පොලෙහි කඩ කාමරයක් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම්දුන් අතර, එම අය සඳහා මහජන පොල කඩකාමරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 බලන්ගොඩ සුසාන භූමි මාර්ගය සංවර්ධනය කර්මාන්තය 1 අදියර - MPS/24/13/59

බලන්ගොඩ සුසාන භූමි මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා වන රු. 500,000.00ක මූල්‍ය ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර අදාල කර්මාන්තය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සිදු කිරීමේ කාර්යය ප්‍රදේශයේ පොදු කටයුතු වල දී ක්‍රියාකාරීව සම්බන්ධ වන තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතියට පැවරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:02 හුණුකුඹුර මහේෂ් මහතාගේ නිවාස වලට යන මාර්ගය I අදියර කර්මාන්තය - MPS/24/13/60

හුණුකුඹුර මහේෂ් මහතාගේ නිවාස වලට යන මාර්ගය I අදියර කර්මාන්තය සඳහා වන රු. 500,000.00ක මූල්‍ය ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර අදාල කර්මාන්තය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරා සිදු කිරීමේ කාර්යය ප්‍රදේශයේ පොදු කටයුතු වල දී ක්‍රියාකාරීව සම්බන්ධ වන තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතියට පැවරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

### 09:01 පොදු වෙළඳසැල අංක 11 කඩකාමරය සඳහා ලංසු කැඳවීම

පොදු වෙළඳසැල අංක 11 කඩ කාමරය සඳහා දෙවන වරටත් 10%ක මුදලක් අඩු කර ලංසු කැඳවන ලදී. මෙහි දී එක් ලංසුවක් හෝ ඉදිරිපත්ව නොතිබූ අතර, මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් වෙතින් ඉදිරි උපදෙස් ලබා ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කරන ලදී.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

### 11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් පහත යෝජනාවන් මහා සභාවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදී.

11:01:01 පෞද්ගලික විදේශ සංචාරයක් සඳහා මාස 03කට නිවාඩු අනුමත කර ගැනීම

11:01:02 මහජන පොල භූමියේ වෙළඳාමේ නිරත අමතර වෙළඳුන්ගෙන් දිනපතා රු.75/- ක මුදලක් අය කිරීම.

11:01:03 බස් නැවතුම්පොල අසළ වෙළඳ සංකීර්ණයට යාබද වාහන නැවතුමට ඇතුලත් කරන වාහන වලින් මුදල් අය කිරීම

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සම්බන්ධව මහා සභාවේ සංවාදයට ලක් වූ අතර, 11:01:03 යටතේ ඇති යෝජනාව අනුව, බස්නැවතුම්පොල අසළ වෙළඳ සංකීර්ණයට යාබද වාහන නැවතුමට ඇතුළත් කරන වාහන වලින් රථවාහන නැවතුම් ගාස්තු වශයෙන්,

- ත්‍රී රෝද රථ වලින් රු. 20.00
- වෑන්, කාර් හා ජීප් රථ සඳහා රු. 30.00
- ලොරි හා ට්‍රැක්ටර් රථ සඳහා රු. 50.00

අයකිරීමට ද, එම අය කරනු ලබන මුදල් වලින් 40%ක ප්‍රමාණයක් කොමිස් මුදලක් වශයෙන් ගාස්තු අයකරන්නා වෙත ගෙවීමට ද, මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින ඉදිරිපත් කරන ලද පහත යෝජනාවගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

11:02:01 බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රයක් ලබා ගැනීම

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර සභාවේ මුදල් තත්ත්වය සලකා බලා පසුව මේ සඳහා කටයුතු කිරීමට තීරණය කරන ලදී.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2013 අප්‍රේල් ලැබීම් විග්‍රහය

- 2013 අප්‍රේල් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 6,621,317.30 |
| වෙනත් ලැබීම් | 2,005,637.99 |
| **මුළු ලැබීම්** | **8,626,955.29** |
| පුනරාවර්තන වියදම් | 3,037,406.52 |
| වෙනත් වියදම් | 3,005,813.52 |
| **මුළු වියදම්** | **6,973,042.84** |

- බළන්ගොඩ තානායමේ 2013.05.01 සිට 2013.05.31 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 2013.05.01 සිට 2013.05.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන්

2013.05.01 සිට 2013.05.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 710,713.90 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 පුස්තකාල උපදේශන කාරක සභාව

2013.06.06 වන දිනැති මෙම සභාවේ පුස්තකාල උපදේශන කාරක සභා වාර්තාවට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ හෙයින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:02 මුදල් කාරක සභාව

2013.06.17 වන දින පැවති මෙම සභාවේ මුදල් කාරක සභා වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:03 තානායම් කාරක සභාව

2013.06.17 වන දින පැවති මෙම සභාවේ තානායම් කාරක සභා වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණුඃ

### 14:01 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමාඃ

ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් මහා සභාව අමතමින් ප්‍රකාශ කළේ, අලුතින් ඉදිකරනු ලබන වෙළඳ කුටි සඳහා කුට ව්‍යාපාරිකයන් පිරිසක් විසින් රු. 15,000.00 බැගින් අය කර ඇති බවයි. මෙය සියළුම නාගරික මන්ත්‍රීතුමන්ලා වෙත අගෞරවයක් බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම අනඳමෙත්ගම පෙරපාසැල සඳහා කම්බිගැසීම සිදු කළ යුතු බවට ද එතුමන් සිහිපත් කරන ලදී.

දොරවෙල ප්‍රදේශවාසීන් සඳහා ඉදිකරන ලද ජල යෝජනා ක්‍රමයේ මෝටරය නැවත එම ව්‍යාපෘතිය වෙත ලබා දීමට කටයුතු කරන මෙන් ද ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් ඉල්ලා සිටින ලදී.

*මහජන පොල කඩ කාමර සම්බන්ධව **ගරු සභාපතිතුමන්** අදහස් දක්වමින්, ප්‍රකාශ කළේ, මහජන පොල ඉතිරි කඩකාමර ඉදිකිරීම මුදල් අඩුකම නිසා නවතා තිබෙන බවත්, ඉඩකඩ ඇති තැන් වල වෙළෙන්දන් භාණ්ඩ විකිණීම සඳහා ඉටිරෙදි ආවරණය කර තිබීම අශෝබන බවත් සඳහන් කළේය. මේ සම්බන්ධව කොන්ත්‍රාත්කරු වෙතින් විමසූ විට, එක් කඩ කාමරයක් සඳහා රු. 25,000.00ක මුදලක් වැය වන බව ප්‍රකාශ කළ බවත්, වෙළෙන්දන් එම මුදල් ප්‍රමාණය ගෙවීමට කැමති වූ බවත් එතුමන් ප්‍රකාශ කළේය. මේ සඳහා මුදල් නොමැති අය සුනිල් රණසිංහ යන අය වෙතින් ණය ලබා ගත් බවත්, සාදන ලද කඩකාමර 40ක් අතරින් මේ වන විට මුදල් ලැබී ඇත්තේ 18කින් බවත්, එක් කඩ කාමරයකින් ආදායම ලෙස රු. 200.00 බැගින් අය වන බවත් ගරු සභාපතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.*

### 14:02 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා

පසුගිය වෙසක් උත්සවය මෙන්ම පොසොන් උත්සවය ද ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් සියළුම ජාතීන්ගේ එකමුතුව සහිතව බළන්ගොඩ නගරයේ සමරන ලද බවත්, වසර 44ක් තිස්සේ වල් බිහිව තිබූ විශුද්ධාරාම විහාරස්ථානය උඩ ඇල්ලෙපොල ජනතාව විසින් එළිපෙහෙළි කොට නැවත වැඳුම් පිදුම් කිරීමට සුදුසු වන පරිදි සකස් කරන ලද බවත්, එය නගරයට පිවිසෙන ඕනෑම අයෙකුට දැක ගත හැකි වන පරිද්දෙන් උස් බිමක පිහිටා ඇති බවත්, මේ සඳහා සහයෝගය දැක්වූ පොලිස් ස්ථානාධිපතිතුමන්, නිලධාරීන් සැමට ප්‍රදේශවාසීන් සහ සියළුම නාගරික මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරන බවත් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කළේය.

#### 14:02:01 *කාරක සභා අවස්ථාව*

*උඩ ඇල්ලෙපොල ඉවුරු කැපීමේ සිද්ධිය සම්බන්ධව වැඩඅධිකාරී වෙතින් අදහස් විමසීමට කාරක සභා අවස්ථාවක් ලබා ගැනීමට ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් යෝජනා කරන ලදී.*

*එම යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කර වැඩ අධිකාරී මහතා හට අදාල ලියකියවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.*

*මේ අවස්ථාවේ දී වැඩ අධිකාරී යූ. වී. දැල බණ්ඩාර මහතා මෙම පස් කැපීමට අදාල ලියකියවිලි මහා සභාවට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම මේ සඳහා මහා සභාවෙන් පළමු වර අදාල අනුමැතිය නොලැබුණ ද පසුව අදාල කැපීම සිදු කරන*

*පුද්ගලයන් විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඇතුළු අදාල අංශයන් වෙතින් අවශ්‍ය නිර්දේශයන් ලබා ගෙන ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී.*

*අදාල නිර්දේශයන්ට අනුව මෙම ඉදිකිරීම සිදු කිරීමෙන් එම ස්ථානයේ ඇති නාය යාමේ අවදානම අඩු වන බව ද වැඩ අධිකාරී යූ. වී. දැල බණ්ඩාර මහතා විසින් පෙන්වා දෙන ලදී.*

*ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් තව දුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කළේ ජේ. එෆ් ආයතනයේ භාවිතය වෙනස් කිරීමට අදාලව පළාත් පාලන ආයතන සම්බන්ධ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවටත්, අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවටත්, Transparancy International ආයතනය වෙතත් පැමිණිලි කිරීමට බලාපොරොත්තු වන බව ද සඳහන් කළේය.*

**14:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් මහා සභාව අමතමින්, තම පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. 125.000.00ක් වටිනා පුටු, මේස ආදිය පෙර පාසැල වෙත ලබා දීමට ඉඩ සැලසීම සම්බන්ධව ගරු සභාපතිතුමන්ට ස්තුතිය පළ කරන බව සඳහන් කළේය.

එමෙන්ම, දෙහිගස්තලාව හා කුමාරගම මාර්ග සංවර්ධනය සඳහා යෝජනා 13ක් ඉදිරිපත් කළ බවත්, එයින් යෝජනා 06ක් අනුමත වූ බවත්, එම ඉල්ලීම් ඉටු කිරීම සම්බන්ධව සබරගමුව පළාත් මාර්ග සංවර්ධන ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමන් හට හා මහා මාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය නිර්මල කොතලාවල මැතිතුමන් හට ස්තුතිවන්ත වන බව ද ගරු නාගරික මන්ත්‍රීතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මෙවර පොසොන් උත්සවය ඉතාමත් ඉහලින් සැමරීමට හැකි වූ බව ද, අවුරුදු 23ක් තිස්සේ පවත්වනු ලබන දෙහිගස්තලාව පොසොන් දන්සල මෙවර ද 60%ක පමණ මුස්ලිම් ප්‍රජාවගේ දායකත්වයෙන් පැවැත්වූ බව ද එතුමන් ප්‍රකාශ කළේය. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ ද බලාපොරොත්තුව වන්නේ රටේ සියළු ජනතාව සමගියෙන් සිටීම බව ද, එතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කළ අතර, රත්නපුර මහ සමන් දේවාලයේ බස්නායක නිළමේ තනතුරට බළන්ගොඩ ප්‍රදේශවාසියකු වන කමල් රත්වත්ත මැතිතුමන් තේරී පත්වීම සම්බන්ධව සතුටට පත් වන බව ද වැඩිදුරටත් සඳහන් කළේය.

**14:04 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් අදහස් දක්වමින්, නගරයේ පවත්වන ලද දන්සල සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා වෙතින් ලැබුණු සහතිකය අගය කරන බව සඳහන් කළේය.

එමෙන්ම මෙවර ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීම සඳහා පහත යෝජනාවන් ඉදිරිපත් කරන බව ද ප්‍රකාශ කරන ලදී.

- බාන්ස් රත්වත්ත මාවත, සන්සිටි ඉදිරිපිට කාණු සඳහා කොන්ක්‍රීට් ආවරණ දැමීම.
- නව අතුරු මාර්ගය මැද ත්‍රීරෝද රථ හරවන බැවින් ඒ සඳහා කොන්ක්‍රීට් ගැට්ටක් සෑදීම.

එමෙන්ම වැඩිදුරටත් අදහස් දක්වමින් එතුමන් ප්‍රකාශ කළේ, පල්ලෙවෙල මාර්ගයේ බැම්ම සෑදිය යුතු බවත් එම ස්ථානයේ ජීවත් වන්නේ ඉතා අසරණ පවුලක් බැවින්, සභාවෙන් එම බැම්ම සාදා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් සභාව අමතමින්ද, අද දින පැවති මහා සභා රැස්වීම ඉතා සාර්ථක පැවති බව සඳහන් කළ අතර එසේ පැවැත්වීම සඳහා සහයෝගය ලබා දුන් සියළුම නාගරික මන්ත්‍රීතුමන්ලා වෙත තම ස්තුතිය පළ කරන බව ප්‍රකාශ කළේය.

ලබන මාසයේ දී පමණ මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් රු. 50,000.00 බැගින් ලබා දීමට බලාපොරොත්තු වන බවත් ද එතුමන් සඳහන් කරන ලදී.

ඉදිරි මාස 03ක පමණ කාලය සඳහා පෞද්ගලික විදේශ සංචාරයක් සඳහා නිවාඩු ගන්නා බැවින් එම කාල සීමාව තුළ සභාපති තනතුරේ වැඩ කටයුතු ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් සිදු කරනු ලබන බව ද, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් උප සභාපති ධුරයේ රාජකාරි ආවරණය සිදු කරනු ඇති බවට ද සියළුම දෙනා එතුමන්ලා වෙත තම සහයෝගය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන බව ද ගරු සභාපතිතුමන් ප්‍රකාශ කළේය.

2013 ජුනි මාසයට අදාල මහා සභා රැස්වීම ප. ව. 1.30ට පමණ අවසන් වූ අතර, පැමිණ සිටි සියළු දෙනාට නැවතත් ස්තුතිය පළ කරමින් සහ සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් ගරු සභාපතිතුමන් විසින් රැස්වීම් වාරය අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,<br>
සභාපති,<br>
බළන්ගොඩ නගර සභාව.